# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 37 දරන රජයේ වැඩ අධ්‍යක්ෂ (නිලනාමය වෙනස් කිරීම) පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1973 සැප්තැම්බර් මස 21 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 37 දරන රජයේ වැඩ අධ්‍යක්ෂ (නිලනාමය වෙනස් කිරීම) පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 1973 සැප්තැම්බර් මස 13 වන දින]

එල්.ඩී.—ඔ. 20/72.

**රජයේ වැඩ අධ්‍යක්ෂගේ නිලනාමය වෙනස් කිරීම සහ මහාමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම හේතුකොටගෙන ලිඛිත නීතියෙහි ලා අවශ්‍ය ආනුෂංගික සංශෝධන කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 37 දරන රජයේ වැඩ අධ්‍යක්ෂ (නිලනාමය වෙනස් කිරීම) පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — **ලුහුඬු නාමය.**

## I වන කොටස

**2.** (මේ කොටසේ මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මංමාවත් ආඥාපනතේ 2 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — **193 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(2) මහාමාර්ග දෙපාර්තමේන්තුව හෝ වැඩ අධ්‍යක්ෂවරයකු ගේ දෙපාර්තමේන්තුවක් නොවන යම් දෙපාර්තමේන්තුවක් විසින් හෝ යම් පාරක් නඩත්තු කරනු ලබන විට, ඒ පාර සම්බන්ධයෙන් මේ ආඥාපනත අදාළ කරවීමේ කාර්යයන් සඳහා, මේ ආඥාපනත හෝ එහි යම් නියත විධිවිධානයක් මේ ආඥාපනතින් හෝ එකී නියත විධිවිධානයෙන් පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්යයන් ඉටු කිරීම එම දෙපාර්තමේන්තුවේ නියත නිලධරයන් විසින් කළ යුතුය යන වෙනස් කිරීමට යටත් ව බල පැවැත් විය යුතු යයි අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:— — **ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

'නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල ආදිය. — 4. (1) මේ ආඥාපනතේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ සියලු නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය හැකි ය.

(2) මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත් ව, එක් එක් දිසාවක වැඩ අධ්‍යක්ෂ විසින් සහ එක් එක් කොට්ඨාසයක විධායක ඉංජිනේරුවරයා විසින් තම දිසාව හෝ කොට්ඨාසය තුළ, මෙම ආඥාපනත ක්‍රියාවෙහි යෙදවීම පිළිබඳ ව වග කිව යුතු ය.

ජ 00492—5,900 (73/9)

(3) මේ ආඥාපනතෙහි—

(අ) "දිසාව" යන්න වැඩ අධ්‍යක්ෂවරයකු හෝ අධිකාරී ඉංජිනේරුවරයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඔහු පත් කරනු ලැබ ඇති ප්‍රදේශය ඉන් අදහස් වේ;

(ආ) "කොට්ඨාශය" යන්න විධායක ඉංජිනේරුවරයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඔහු පත් කරනු ලැබ ඇති ප්‍රදේශය අදහස් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:—

"පාරවල්වල වැඩ පිළිබඳ කළමනාකරණය සහ වෙනස් බලතල අධ්‍යක්ෂ වෙත පැවරෙන බව.

8. යම් පාරක් සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ භාරගනු ලබන සියලු වැඩ පිළිබඳ විධානය සහ පාලනය අධ්‍යක්ෂ වෙත පවරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "අධ්‍යක්ෂ" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන්:—

'"අධ්‍යක්ෂ" යන්නෙන් මහාමාර්ග අධ්‍යක්ෂ අදහස් වන අතර ඊට—

(i) මහාමාර්ග නියෝජ්‍ය අධ්‍යක්ෂ,

(ii) මේ ආඥාපනත යටතේ මහාමාර්ග අධ්‍යක්ෂගේ යම් බලයක්, කාර්යයක් හෝ කටයුත්තක් සම්බන්ධයෙන් වූ විට ඒ බලය ක්‍රියාත්මක කිරීමට, ඒ කාර්යය ඉටු කිරීමට හෝ ඒ කටයුත්ත කිරීමට ඒ අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් සහකාර මහාමාර්ග අධ්‍යක්ෂවරයෙක්,

(iii) අදාළ ප්‍රදේශය තුළ බලය දරන වැඩ අධ්‍යක්ෂ,

(iv) අදාළ ප්‍රදේශය තුළ බලය දරන නියෝජ්‍ය වැඩ අධ්‍යක්ෂ, සහ

(v) මේ ආඥාපනත යටතේ මහාමාර්ග අධ්‍යක්ෂගේ යම් බලයක්, කාර්යයක් හෝ කටයුත්තක් සම්බන්ධයෙන් වූ විට මහාමාර්ග අධ්‍යක්ෂගේ ඒ බලය ක්‍රියාත්මක කිරීමට, ඒ කාර්ය ඉටු කිරීමට හෝ ඒ කටයුත්ත කිරීමට වැඩ අධ්‍යක්ෂ විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් සහකාර වැඩ අධ්‍යක්ෂවරයෙක් ද

ඇතුළත් වෙති;';

(ආ) "විධායක ඉංජිනේරුවරයා" යන අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"විධායක ඉංජිනේරුවරයා" යන්නෙන් යම් කොට්ඨාස යක විධායක ඉංජිනේරුවරයා අදහස් වේ;'; තවද

(ඇ) "අධිකාරි ඉංජිනේරුවරයා" යන අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"අධිකාරි ඉංජිනේරුවරයා" යන්නෙන් යම් දිසාවක අධි කාරි ඉංජිනේරුවරයා අදහස් වේ.'.

6. ප්‍රධාන ප්‍රඥප්තියෙහි "රජයේ වැඩ දෙපාර්තමේන්තුව", "රජයේ වැඩ අධ්‍යක්ෂ" සහ "දිස්ත්‍රික්කය" යන යෙදුම් යෙදී ඇති කවර තැනක වුව ද— *(ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් යෙදුම් ආදේශ කිරීම.)*

(අ) "රජයේ වැඩ දෙපාර්තමේන්තුව" යන යෙදුම වෙනුවට "මහාමාර්ග දෙපාර්තමේන්තුව හෝ වැඩ අධ්‍යක්ෂවරයකු ගේ දෙපාර්තමේන්තුවක්" යන යෙදුම ද;

(ආ) "රජයේ වැඩ අධ්‍යක්ෂ" යන යෙදුම වෙනුවට "අධ්‍යක්ෂ" යන යෙදුම ද;

(ඇ) "දිස්ත්‍රික්කය" යන යෙදුම වෙනුවට "කොට්ඨාසය" යන යෙදුම ද

ඒ ප්‍රඥප්තියේ ආදේශ කරනු ලැබේ.

## II වන කොටස

7. පාරවල් (පාලනය පැවරීම) පිළිබඳ පනත, එහි 5 වන වගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(194 වන අධිකාරයේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*"බලපත්‍ර සහ මැණීම් අත් හැරීම.*

5. යම් ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික්ක කාරක සභා වක් විසින් හෝ එහි අධිකාරය යටතේ, 1951 අප්‍රේල් 1 වන දිනට පෙර මංමාවත් ආඥාපනත යටතේ දෙන ලද සියලු ම බලපත්‍ර සහ කරන ලද සියලුම මැණීම්, මහාමාර්ග අධ්‍යක්ෂ විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ හෝ වැඩ අධ්‍යක්ෂවර යකු විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ හෝ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ඒ වැඩ අධ්‍යක්ෂගේ දෙපාර්තමේන්තුවේ නියමිත නිලධර යකු විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ දෙන ලද බලපත්‍ර හෝ කරන ලද මැණීම් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒවා බල පැවැත්විය යුතු ය.".

## III වන කොටස

8. (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වතු පාරවල් පිළිබඳ ආඥාපනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— *(195 වන අධිකාරයේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

“පාරක් ඉදිකිරීම සඳහා ඉල්ලුම් කිරීම.

2. (1) එක ම ප්‍රදේශයක් තුළ පිහිටියා වූ ද යම් පහසු ප්‍රධාන මංමාවතක සිට ආරම්භ වන මාවතක් හෝ අතුරු පාරක් නොමැත්තා වූ ද යම් වතු දෙකක හෝ ඊට වැඩි ගණනක අයිතිකරුවන් විසින් මේ ආඥාපනතේ විධිවිධාන එකී ප්‍රදේශයට ව්‍යාප්ත කරන ලෙස ඒ වතු පිහිටි දිසාවේ වැඩ අධ්‍යක්ෂකගෙන් ලියවිල්ලකින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, දැනගත හැකි තාක් දුරට, පහත සඳහන් විස්තර එම ඉල්ලීමෙහි සඳහන් කළ යුතු ය:—

(අ) ප්‍රදේශයෙහි විස්තරය;

(ආ) එහි ඇති සියලුම වතුවල නම්;

(ඇ) එක් එක් වත්තක අයිතිකරුවන්ගේ නම් හෝ ඔවුන් ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටිත් නම්, නේවාසික කළමනාකරුගේ හෝ අධිකාරිගේ සහ අනුයෝජිතයන් (සිටිත් නම්) ඔවුන්ගේ නම්;

(ඈ) දැනගත හැකි තාක් දුරට එක් එක් වත්තක අක්කර ගණන හා වගාකර ඇති ඉඩම් ප්‍රමාණය;

(ඉ) එකී වතු වඩාත් ම පහසු ප්‍රධාන මාවත සමග සම්බන්ධ කිරීම සඳහා ඉදිකිරීමට අවශ්‍ය පාරේ ගණන් බලන ලද දිග ප්‍රමාණය, සැතපුම්වලින්;

(ඊ) අවශ්‍ය පාරේ විස්තරය.

(2) වැඩ අධ්‍යක්ෂ විසින් අවශ්‍යයයි සලකනු ලැබුවහොත්, සෑහෙන පරිමාණයක් අනුව අඳින ලද යෝජිත පාරේ සැලැස්මක් සහ ඒ පාරේ කොටසක් ද පාරේ එක් එක් සැතපුම් භාගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම දක්වන විස්තර සහිත ඇස්තමේන්තුවක් ද සියලු ම ඉල්ලීම් සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) දිසා දෙකක් ඇතුළත වතු පිහිටා තිබෙන යම් අවස්ථාවක, මේ ආඥාපනතින් පවරා ඇති බලතල ඒ අවස්ථාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ඉන් යම් දිසාවක වැඩ අධ්‍යක්ෂට බලය පැවරිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම.

41. (1) මේ ආඥාපනත මගින් වැඩ අධ්‍යක්ෂ වෙත පවරනු ලැබ ඇති හෝ නියම කරනු ලැබ ඇති යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක් වැඩ අධ්‍යක්ෂ විසින් බලය පවරනු ලැබුවහොත් අධිකාරි ඉංජිනේරුවරයා විසින් තම දිසාව ඇතුළත හෝ විධායක ඉංජිනේරුවරයා විසින් තම කොට්ඨාසය ඇතුළත හෝ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම හෝ කළ හැකි ය.

(2) මේ ආඥාපනත යටතේ වැඩ අධ්‍යක්ෂගේ, අධිකාරි ඉංජිනේරුවරයාගේ සහ විධායක ඉංජිනේරුවරයාගේ බලතල, කටයුතු සහ කාර්යයන්, මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත් ව, ක්‍රියාත්මක කිරීම ද ඉටු කිරීම ද කළ යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ හැර ඒ ප්‍රඥප්තියෙහි "අධිකාරි ඉංජිනේරුවරයා" යන යෙදුම යෙදී ඇති කවර තැනක වුව ද "වැඩ අධ්‍යක්ෂ" යන යෙදුම ඒ වෙනුවට ආදේශ කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් යෙදුමක් ආදේශ කිරීම.

## IV වන කොටස

11. (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) වතු පාරවල් ප්‍රසිද්ධ පාරවල් බවට හැරවීමේ පනතේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

196 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) එම පාර නඩත්තු කිරීමේ වගකීම වැඩ අධ්‍යක්ෂ වෙත පැවරිය යුතු ද නැතහොත් ඒ නියමය බලපාන වත්තේ අයිතිකරු හෝ අයිතිකරුවන් වෙත පැවරිය යුතු ද යන්න මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විමසීමෙන් පසු තීරණය කළ යුතු ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, එහි (1) වන සහ (2) වන උපවගන්ති වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) ප්‍රසිද්ධ පාරවල් පිළිබඳ නියමයක් මගින් ප්‍රසිද්ධ පාරක් නඩත්තු කිරීමේ වගකීම යම් වත්තක අයිතිකරු හෝ අයිතිකරුවන් වෙත පවරන ලද අවස්ථාවක මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විමසීමෙන් පසු, පාරවල් පිළිබඳ අදාළ බලධරයා විසින්—

(අ) මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් කලින් කල ඒ අයිතිකරුට හෝ අයිතිකරුවන්ට ගෙවිය යුත්තේ ඒ නඩත්තු වැයෙන් කවර කොටසක් ද යන වග; සහ

(ආ) ඒ වත්ත එක් තැනැත්තකුට වැඩි දෙනකුට අයිති ව තිබෙන අවස්ථාවක ආණ්ඩුවේ දායක මුදල ඒ වත්තේ අයිතිකරුවන්ට බෙදා දීම ද

තීරණය කළ යුතු ය.

(2) පාරවල් පිළිබඳ අදාළ බලධරයාගේ චුවමනාව පිට හෝ මේ පනත යටතේ පාරක් නඩත්තු කිරීමේ වගකීම පවරනු ලැබ ඇති වත්තේ අයිතිකරුවකු විසින් හෝ අයිතිකරුවන්ගෙන් ඕනෑම කෙනකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ බලධරයා විසින් ගනු ලබන අලුත් තීරණයක් අනුව ඒ පාර නඩත්තු කිරීමේ වියදම වෙනුවෙන් මෙම පනත යටතේ දෙනු ලබන ආණ්ඩුවේ දායක මුදල එම බලධරයා විසින් මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විමසා කලින් කල වැඩි කිරීම හෝ අඩු කිරීම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" වතු අයිතිකරුවන් විසින් ප්‍රසිද්ධ පාරවල් නඩත්තු කිරීම.

7. (1) පාරක් නඩත්තු කිරීමේ වගකීම වත්තක අයිතිකරුවකු හෝ අයිතිකරුවන් වෙත මේ පනත යටතේ පවරන ලද අවස්ථාවක, මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින්, තම දැන්වීමෙහි නියමිත කාලය තුළ එම පාර නඩත්තු කිරීම සම්බන්ධයෙන් එහි නියම කොට ඇති වැඩ කරන මෙන් විධාන කරමින්, ඒ වත්ත භාර ව සිටින තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් ලිඛිත දැන්වීමක් යැවීමට සැලැස්විය යුතු අතර ඒ වත්තේ අයිතිකරු හෝ එක් එක් අයිතිකරු ශ්‍රී ලංකාවේ පදිංචි ව සිටින්නේ නම් හා ඔහුගේ ලිපිනය ද දැන සිටින්නේ නම් ඒ දැන්වීමේ පිටපතක් ඔහු වෙත ද ලියා පදිංචි තැපෑලෙන් යැවීමට සැලැස්විය යුතු ය.

(2) වත්තක් භාර ව සිටින තැනැත්තා වෙත (1) වන උපවගන්තිය යටතේ යවන ලද දැන්වීමක් අනුව ඔහු ක්‍රියා කරන අවස්ථාවක, මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින්, ඒ වත්තේ අයිතිකරු හෝ එක් එක් අයිතිකරු ශ්‍රී ලංකාවේ පදිංචිකරුවකු නම් සහ ඔහුගේ ලිපිනය දන්නේ නම්, එම දැන්වීම අදාළ වන පාර නඩත්තු කිරීමේ වියදම වෙනුවෙන් මේ පනත යටතේ ආණ්ඩුවේ දායක මුදලින් ඒ අයිතිකරුට හෝ ඒ එක් එක් අයිතිකරුට හිමි ප්‍රමාණය දිය යුතු අතර ඒ මුදල් ප්‍රමාණය දෙනු ලැබුයේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා එය භාර ගැනීමට කැමති වුවහොත් ඒ මුදල ඔහුට ගෙවිය යුතු ය.

(3) වත්තක් භාර ව සිටින තැනැත්තා වෙත (1) වන උපවගන්තිය යටතේ යවන ලද දැන්වීමක් අනුව ක්‍රියා කිරීම ඔහු විසින් පැහැර හැර ඇති අවස්ථාවක, මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින්, දැන්වීමේ සඳහන් වැඩ එම දිසාවේ වැඩ අධ්‍යක්ෂගේ දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබීමට සැලැස්විය යුතු අතර එම වැඩ කිරීමෙහි ලා ඒ වැඩ අධ්‍යක්ෂගේ දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම වෙනුවෙන් මේ පනත යටතේ ආණ්ඩුවෙන් දෙන ලද ආයක මුදල අඩු කිරීමෙන් පසු ඉතුරු වියදම, මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් ලියවිල්ලකින් ඉල්ලා සිටි විට, ඒ ලේකම් විසින් ඉඩ දෙනු ලැබ ඇති කාලය තුළ එම වත්තේ අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් ඒ ලේකම් වෙත ගෙවිය යුතු ය.

(4) වත්තක අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් (3) වන උපවගන්තිය යටතේ මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ට ගෙවිය යුතු යම් මුදලක් ඒ ලේකම් විසින් ඉඩ දෙන ලද කාලය තුළ නොගෙවන ලද අවස්ථාවක, ඒ ලේකම් විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් එම වත්තේ පලදාව සහ ඒ වත්තට අයත් යම් වංචල දේපලක් තහනමට ගෙන විකුණනු ලැබිය හැකි අතර ඒ ලේකම් විසින් ඉහත කී මුදල සහ තහනමට ගෙන විකිණීම සම්බන්ධයෙන් දරන ලද වියදම එකී විකිණීමෙන් ලැබෙන මුදලින් අඩු කර ගැනීමටත්, ඉන් ඉතිරි වන මුදල ඒ අයිතිකරු හෝ අයිතිකරුවන් වෙත ආපසු දීමටත් සැලැස්විය යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.*

*"මහා මාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ බලතල හා කාර්යයන් පැවරීම.*

12. මහාමාර්ග විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත මේ පනතින් පවරා ඇති හෝ නියම කර ඇති බලතල හෝ කාර්ය අතුරින් යම් බලයක් හෝ කාර්යයක් ඒ ලේකම් විසින් වැඩ අධ්‍යක්ෂවරයකුගේ දෙපාර්තමේන්තුවක යම් විධායක ඉංජිනේරුවරයකු වෙත ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් පවරනු ලැබිය හැකි ය.".

## V වන කොටස

15. (මේ කොටසෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) වාරිමාර්ග ආඥාපනතේ 75 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියට ඉක්බිති ව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *453 වන අධිකාරයේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.*

'(4) 65 වන වගන්තියේ, 66 වන වගන්තියේ සහ මේ වගන්තියේ "දිසාපති" යන්නෙන් අදාළ ප්‍රදේශය තුළ බලය දරන දිසාපති අදහස් වන අතර ඊට —

(අ) සහකාර දිසාපතිවරයෙක් ;

(ආ) අතිරේක සහකාර දිසාපතිවරයෙක් ;

(ඇ) අදාළ ප්‍රදේශය තුළ බලය දරන වැඩ අධ්‍යක්ෂවරයෙක්, නියෝජ්‍ය වැඩ අධ්‍යක්ෂවරයෙක් සහ සහකාර වැඩ අධ්‍යක්ෂ වරයෙක් ;

(ඈ) අදාළ ප්‍රදේශය තුළ බලය දරන අධිකාරි ඉංජිනේරුවරයෙක් ; සහ

(ඉ) අදාළ ප්‍රදේශය තුළ බලය දරන විධායක ඉංජිනේරුවරයෙක් ද ඇතුළත් වෙති.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය, "ගොවිකාරක සභා අනුයෝජිතයා" යන අර්ථකථනයට ඉක්බිති ව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'"වාරිමාර්ග අධ්‍යක්ෂ" යන්නට—

(අ) අදාළ ප්‍රදේශය තුළ බලය දරන වැඩ අධ්‍යක්ෂවරයෙක්, නියෝජ්‍ය වැඩ අධ්‍යක්ෂවරයෙක් සහ සහකාර වැඩ අධ්‍යක්ෂ වරයෙක් ;

(ආ) අදාළ ප්‍රදේශය තුළ බලය දරන අධිකාරි ඉංජිනේරුවරයෙක් ; සහ

(ඇ) අදාළ ප්‍රදේශය තුළ බලය දරන විධායක ඉංජිනේරුවරයෙක් ද

ඇතුළත් වෙති.'.

## VI වන කොටස

අතීතයටත් බලපෑම.

17. මේ පනතේ ඉහතින් වූ විධිවිධාන මගින් (193 වන අධිකාරය වූ) මංමාවත් ආඥාපනතේ ද (194 වන අධිකාරය වූ) පාරවල් (පාලනය පැවරීම) පනතේද (195 වන අධිකාරය වූ) වතු පාරවල් පිළිබඳ ආඥාපනතේ ද (196 වන අධිකාරය වූ) වතු පාරවල් ප්‍රසිද්ධ පාරවල් බවට හැරවීමේ පනතේ සහ (453 වන අධිකාරය වූ) වාරිමාර්ග ආඥාපනතේ කරන ලද සංශෝධන 1969 ඔක්තෝබර් 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.